අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 වන ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද, මණ්ඩලය විසින් අවස්ථා දෙකකදී එකතුව රු.1,527,500 ක්වූ ආදායම් වලින් එකතුව රු.1,708,730 ක්වූ වියදම් හිලව් කර රු.181,230 ක් ශුද්ධ වියදම් ලෙස දක්වා තිබුණි.	ආදායම් හා වියදම් ලෙජරය තුල වෙන වෙනම ගිණුම්ගත වී ඇති අතර මූල්‍ය ප්‍රකාශන වලදි ශුද්ධ වෙනස පමණක් ඉදිරිපත් කර ඇත. මෙවැනි ගිණුම්කරණ දෝෂයන් ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරන බව.	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ගිණුමේ ශේෂය රු.279,295,776 ක් වූ අතර, ඊට රු.35,510,876 ක්වූ ගොඩනැගිලි පිරිවැය	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන බව.	-එම-

	වටිනාකමත් රු.243,784,900 ක්වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණන වටිනාකමත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.		
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.288,900 ක් වූ මෝටර් වාහන, රු.1,484,156 ක් වූ පුස්තකාල පොත් සහ රු.27,274,126 ක් වූ රසායනාගාර උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. ඒ අනුව සිදු වී තිබූ ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	වත්කම් වල ඵලදායී ජීවකාලය නැවත සමාලෝචනය කර ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවත් ප්‍රායෝගිකව මෙම වත්කම් වල ජීවකාලය/ධාරණ අගය ඇස්තමේන්තු කිරීම සඳහා පිරිවැයක් වැය වේ. එමඟින් මණ්ඩලයට එකතු කළ අගයක් නොමැති හෙයින් ප්‍රායෝගිකව සිදු කර නැති බව.	-එම-
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 හි 44 ජේදය ප්‍රකාරව වත්කමක් ලෙස හඳුනාගත් හුවමාරු නොවන ගණුදෙනුවකින් වන සම්පත්වල ගලාඒමක් අයභාරයක් ලෙස හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවද,සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.40,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.තවද 2018 වර්ෂයට පෙර ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ප්‍රමිතියේ 124 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 162,845,947ක ශේෂයක් හිමිකම් යටතේ හදුනාගෙන තිබුණි.	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන , 2025 වර්ෂයේ සිට අවසන් ගිණුම් තුල ආදායමක් ලෙස ගැනීමට කටයුතු කරමි.2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි 2024 වර්ෂය සඳහා මෙම ගැළපීම සිදු කිරීමට බලාපොරොත්තු වන අතර 2023 දක්වා ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රදාන ඉදිරියට ගෙන ආ ප්‍රාග්ධන සංචිතයට ගැළපීම් කිරීමට කටයුතු කරන බව.	-එම-

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1992 වර්ෂයේදී රු.4,350,000 ක වටිනාකමට 99 අවුරුදු බදු පදනම මත ලබාගත් කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලීය ඉඩම 2018 වර්ෂයේදී රු.365,000,000ක අගයකට ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණිත වටිනාකම සංචිත ගිණුමක රඳවාගෙන තිබුණි. මණ්ඩලයට අයත් නොවන මෙම බදු ඉඩම් ප්‍රත්‍යාගණිත කළ නොහැකි අතර එමඟින් උත්පාදනය වූ සංචිත වටිනාකම් ගිණුම් වලින් ලියාහැරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් හා සංචිත වටිනාකම රු.360,650,000ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව	ගිණුම් වල වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇති ප්‍රත්‍යාගණිත අගය, 2025 වර්ෂය තුලදී වත්කම් ගිණුමෙන් සහ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමෙන් ගැළපුම් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන වල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

	ප්‍රකාශයේ දක්වා තිබුණි. තවද, බදු වටිනාකම රු.4,350,000 ක්වූ මෙම ඉඩම වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමටද කටයුතු කර නොතිබුණි.		
(ආ)	තිස් අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති වටිනාකම රු.4,085,019ක් වූ හෝමාගම පිටිපන ඉඩම,ඉඩම් ගිණුම යටතේ දක්වා තිබුණද වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිවිසුමකට එළඹූ පසු පෙර වර්ෂ ගැළපුම් ජ'නල් සටහනක් මඟින් , ගෙවී ගිය වර්ෂ වලට අදාළ ක්‍රමක්‍ෂය ප්‍රමාණය ගිණුම් වල ගැළපීමට කටයුතු කරන බව.	-එම-
(ඇ)	ගාල්ල සහ තලංගම පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටි, සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ඉඩම් වල මණ්ඩලය විසින් රු. 33,834,959 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණද මෙම ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ඉඩම් වන අතර පවරා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය සහ අනෙකුත් කටයුතු සිදුවෙමින් පවතී. එතෙක් මණ්ඩලයේ ගිණුම්පොත් වල වත්කම් ලෙස ගිණුම්ගත කළ නොහැකි බව.	ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවෙන් බැහැර වැටුප් රහිත රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමට අදාලව ඇතිකරගත් ගිවිසුම් කඩ කරන ලද නිළධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් අයකළ යුතු එකතුව රු. 1,425,699ක මුදල ගිණුම් ගතකර නොතිබුණි.	මෙම දෝෂය 2025 වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අනුගමනය කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 2.1 යටතේ දක්වා තිබුණු අතර, පාරිතෝෂික ගණනය කිරීම හා ගිණුම් තැබීම සඳහා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 19 අනුගමනය කර තිබුණි.එසේ වුව ද සටහන් අංක 2:5 යටතේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (LKAS 19) අනුව සේවක පාරිතෝෂික වෙන් කිරීම් සිදුකර ඇති බව දක්වා තිබුණි. තවද,සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම රු.47,222,561 ක ශේෂය තුල සේවයේ නොමැති නිලධාරීන් තිදෙනෙකු සඳහා රු.329,410 ක පාරිතෝෂික වෙන්කිරීම් වැඩියෙන් සහ තනතුර අතහැර ගිය එක් නිළධාරියෙකුට අදාළ ගෙවිය යුතු පාරිතෝෂික වෙන් කිරීම් රු.131,662 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් රු.197,748 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ලෙස දැක්වීම දෝෂයකි. 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ පාරිතෝෂික ගෙවීම් වගකීම රු.329,410 ක ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා ඇත. 2021 නොවැම්බර් 19 දින සේවය අතහැර ගිය නිලධාරියා සේවය හැරගොස් ඇති බව මානව සම්පත් අංශය විසින් මූල්‍ය අංශයට විධිමත්ව දන්වා නැත. අදාළ දෝෂ 2025 වර්ෂයේ ගිණුම් තුළ ගැළපීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනවල මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තැන්පතු සහතික	566,263	තැන්පතු සහතික පත්‍ර	මෙම තැන්පතු වලට අදාල සහතික අතීතයේ අස්ථානගත වී ඇති බව.	ශේෂය ඊට අදාල ආයතන මගින් තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය.

1.6 ලැබිය යුතු ගිණුම්

1.6.1 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වසර 20 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,434,534 ක හර ශේෂය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම් පිළිබඳව ලිඛිත තොරතුරු වගකිව යුතු අංශ සතුව නොපැවතුණු අතර එකී විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව ශේෂයන් කපා හැරීම සඳහා කටයුතු කරන ලෙස භාණ්ඩාගාර මුල්‍ය අධ්‍යක්ෂගෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව, 2024 ජූනි 06 දින රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය සඳහා ලිපියක් යොමු කොට ඇත.	චක්‍රලේඛ වල උපදෙස් අනුව කටයුතු කළ යුතුයි.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නිති විරෝධි ලෙස ජාවාරම් කිරිම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) වැනි ජේදයට අනුව සාදනු ලැබූ 2010 මැයි 10 දිනැති නියෝග අංක 1653/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය			
(i) 5 ජේදය	පුරෝගාමී පාලන අධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරිම	2017 ජනවාරි 11 දිනැති DMS/1683/Vol-III අංක දරන කළමනාකරණ සේවා	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව

	,ඉවුකිරිම සහ සිදුකිරිම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධාරීන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද පූරෝගාමී අධිකාරියට 2024 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කර නොමැති අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරින් හතර දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.	දෙපාර්තමේන්තු ලිපිය මඟින් පූරෝගාමී පාලන අධිකාරියේ ලේකම් තනතුර ඉවත් කර ඇති අතර, අනෙකුත් තනතුරු 07 මණ්ඩලයට අනුයුක්ත කර ඇත. මේ වන විට පූරෝගාමී පාලන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තනතුරු වැඩිකිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කිරීමට නියමිතව ඇති බව.	කටයුතු කළ යුතුය.
(ii) 7 , 8 හා 10 ඡේද	2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරිමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරියේ මණ්ඩලය 2024 වර්ෂයේ එක් අවස්ථාවක් පමණක් රැස් වී තිබූ අතර නියෝග 8 හා 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පූරෝගාමී අධිකාරියේ මණ්ඩලයේ සාමාජිකයන් විසින් සමාලෝචනය සිදු කිරීම සඳහා පූරෝගාමී අධිකාරියේ මණ්ඩලය අවම රැස්වීම් ප්‍රමාණයවත් පවත්වා නොතිබුණි.	2025 වර්ෂයේ සිට මණ්ඩලීය ලේකම් ගේ සම්බන්ධීකරණයෙන් මාණ්ඩලික රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇති බව.	-එම-
(iii) II වැනි කොටස පරීශ්‍ර ලියාපදිංචි කිරීම නියෝග 9	ද්‍රව්‍ය ආනයන කිරීමට හෝ අපනයන කිරීමට අදාල වන කාර්යයන් කරගෙන යන්නා වූ පරිශ්‍රයන් බලපත්‍ර නිකුත් කල දින සිට මසක් ඇතුළත සෑම බලපත්‍රලාභියකු විසින්ම අධිකාරිය සමඟ ලියාපදිංචි විය යුතු අතර පරිශ්‍ර 10 ක් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ලැබී තිබුණද, එක් පරිශ්‍රයක් සඳහා හෝ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.	සේවක හිඟතාවය නිසා නියමිත කාලයට ලබාදීමට නොහැකියාව මේ වන විටත් පැවතියද 2024 ලියාපදිංචි වූ එම පරිශ්‍ර මේ වනවිට පරීක්ෂා කර අවසන් වී ඇති අතර එම බලපත්‍ර නිකුත් කිරීමට අදාල ඉදිරි කටයුතු සිදුකරගෙන යමින් පවතින බව.	-එම-

(iv)	III වැනි කොටස අධීක්ෂණය හා පරීක්ෂාව නියෝග 13	අධිකාරියේ සාමාජිකයින් අවම වශයෙන් මාස 3 ට වරක් වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය කළ යුතු අතර, ද්‍රව්‍යයන් ගබඩා කර ඇති ආකාරය, උපකරණ භාවිතය පවත්වාගෙන යනු ලබන පොත්, ලේඛන ,රෙජිස්ටර් සහ වාර්තා පරීක්ෂා කර යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි ආනයන කරුවන් 263 දෙනෙකුගේ පරිශ්‍ර 33 ක් පමණක් පරීක්ෂා කර තිබුණි.	මෙම කටයුතු තවදුරටත් විධිමත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සභාය ලබා ගනිමින් පරිශ්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට සහ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	-එම-
(ආ)	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 12 දිනැති අංක1653/19 -2010 දරන ගැසට් පත්‍රයේ නියෝග අංක 2	ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් රැක බලා ගැනීම හා පුනරුත්ථාපනය කිරීමේ කාර්යය සඳහා නියෝග ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පවත්වාගෙන යා නොහැකි වුවද, 2024 වර්ෂය අවසන් වන විට රට තුල පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක් පැවති අතර පෞද්ගලික පුනරුත්ථාපන මධ්‍යස්ථාන 13 ක පමණක් බලපත්‍ර ලියාපදිංචිය යාවත්කාලීන කර තිබුණි.ඒ අනුව 2025 මැයි 16 විගණන දින වන විට ඉතිරි පෞද්ගලික මධ්‍යස්ථාන 13 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ බලපත්‍ර රහිතව පවත්වා ගෙන ගොස් තිබුණි.	විවිධ ප්‍රදේශ තුල මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26ක් පවත්වාගෙන යන අතර ඉන් නව බලපත්‍ර අයදුම් කර ඇති ප්‍රතිකාර මධ්‍යස්ථාන 13ට අවශ්‍ය බලපත්‍ර ලබාදීම සඳහා ලැබී ඇති ආරක්ෂණ නිෂ්කාශන වාර්තා හා ගැසට් පත්‍රයෙහි ඇති විධිවිධාන වලට අනුව මධ්‍යස්ථානය පවත්වාගෙන යන්නේ ද යන්න සම්බන්ධයෙන් සළකා බලා බලපත්‍ර ලබාදීමට සුදුසු ද නැද්ද යන්න තීරණය කිරීමට නියමිත බව.	පනතට අනුසාංගිකව නිකුත් කර ඇති නියෝග අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඊ) ඡේදය හා 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 7 ඡේදය	අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානව සහ අනෙකුත් සම්පත් ලබා දීම ඉහළ කළමනාකරණයේ වගකීම වුවත්, මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණක පමණක් පත්කර තිබුණු අතර,ස්ථිර සහය කාර්ය මණ්ඩලයක් පත්කර නොතිබුණි.	මේ වන විට ස්ථිර ලෙස සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර ඇති අතර, කළමනාකරණ සහකාර තනතුරේ පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලැබීමෙන් පසු අභ්‍යන්තර විගණන අංශය වෙත කළමනාකරණ	විගණන පනත හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

			සහකාරවරුන් අනුයුක්ත කිරීමට නියමිත බව.	
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර අත්පොතේ 3.3 ඡේදය	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත්, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.	උපාය මාර්ගික මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය සේවක පුරෝකථනයක් මේ වන විට සිදු කරමින් පවතින බව.	චක්‍රලේඛ වල උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුයි.
(ඉ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 2022/03 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03(viii) වගන්තිය	සේවක රක්ෂණ ක්‍රමය වෙනුවෙන් 2023 හා 2024 වර්ෂ වලට අදාලව රු.5,302,555ක මුදලක් චක්‍රලේඛයේ උපදෙස් වලින් බැහැරව ගෙවා තිබුණි.	2023 වර්ෂයේ සැප්තැම්බර් සිට ඉදිරියට මාස 12 ක් සඳහා මුදල ගෙවා ඇති අතර උපචිත පදනම මත කළ ඉදිරියට ගෙවීම් මාස 9ට අදාළ ප්‍රමාණය 2024 වර්ෂයේ ගිණුම් වල වියදමක් ලෙස සඳහන් කර ඇත. මණ්ඩලයේ, වර්තමාන අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් සේවක රක්‍ෂණ ක්‍රමය තාවකාලිකව අත්හිටුවා ඇත.	-එම-
(ඊ)	2024 මැයි 31 දිනැති අංක 01/2020 (iii) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය			
	(i) 5.1ඡේදය	පාර්ලිමේන්තුවේ සම්මත කර ඇති පනතක් හෝ වෙනත් යම් නීතියකින් ගාස්තු සංශෝධනය පිළිබඳව විධිවිධාන සලස්වා ඇති ආයතන වලට එම පනත හෝ නීතිය මගින් නියම කර ඇති ආකාරයට ගාස්තු සංශෝධනය කළ යුතු වුවද, 2010 මැයි 10 දින අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද නියෝග අංක 1653/7 හා 2010 මැයි 12 දින නිකුත් කරන ලද නියෝග අංක 1653/19 අනුව සකස් කරන ලද ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතට අනුශාංගිකව නිකුත් කරන ලද අංක 1653/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන්ව ඇති ගාස්තු සහ 2008 අංක 01 දරන මාදක ඖෂධ සහ මනෝවර්ථක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතට ආනුශාංගිකව නිකුත් කරන ලද අංක 1653/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන්ව ඇති ගාස්තු සංශෝධනය කිරීමට	-එම-

				තීරණය කර ඇති අතර ඊට අදාළ සංශෝධන ඉදිරියේදී සිදු කිරීමට නියමිත බව.
(ii)	5.2 ඡේදය	මහජනයා වෙත සේවා සම්පාදනය කිරීමේදී අයකරනු ලබන ගාස්තු වසර තුනකට වරක් සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-

2. **මූල්‍ය සමාලෝචන**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,707,432 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,248,627 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,458,805 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් මෙහෙයුම් වියදම් වැඩිවීම ,වර්ෂයේ ක්ෂය වැඩිවීම හා මානව සම්පත් සංවර්ධන වියදම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2014 අප්‍රේල් 30 දින, තිස් අවුරුදු බදු පදනම මත රු.4,085,018කට ලබාගෙන තිබූ හෝමාගම පිටිපන පිහිටි ඉඩමෙහි මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නා පුද්ගලයින් හට ප්‍රතිකාර කිරීමට හා ඔවුන්ව පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 124/2013 මණ්ඩලීය පත්‍රිකාව මගින් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගෙන තිබුණි.එසේ වුවද එම ඉඩම අපේක්ෂිත කාර්යය වෙනුවෙන් යොදා නොගෙන වසර 10ක කාලයක් නිෂ්කාර්යව පැවති අතර ඉඩමට අදාල බදු ඔප්පුව ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	විෂය ගත ඉඩම් කොටස, ඉඩම් අත්කරගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති නමුත් බදු ගිවිසුම අත්සන් කිරීම සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ වන නිදහස් දීමනා පත්‍රය එම අධිකාරිය වෙත හිමි වී නොමැත.ඉඩම සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමට කිසිඳු බාධාවක් නොමැති බව නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. මෙහි නව ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඉදිකිරීම සම්බන්ධයෙන් යෝජනාවක් මේ වන විට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර ඇති බව.	ඉඩම ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 4 (02) සහ (03) වගන්ති ප්‍රකාරව බලය පැවරී ඇති නිළධාරියෙකුට යුක්ති සහගත වේලාවන්හිදි පනත යටතේ	පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26න් 13කට බලපත්‍ර ලබා දී ඇති අතර පනත ප්‍රකාරව එම බලපත්‍ර ලබාදුන් මධ්‍යස්ථාන පමණක් නිරීක්ෂණයට භාජනය කරන ලදි. විගණන	පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන පරීක්ෂා කර කාලාන්තරීය

බලපත්‍ර දී තිබෙන හෝ නාමෝදිෂ්ය යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරික්ෂාවන් සිදු කල හැකි වුවද මධ්‍යස්ථාන 26 න් 2024 වර්ෂයේදී මධ්‍යස්ථාන 13 ක් පමණක් පරික්ෂාවට ලක් කර තිබුණ අතර නියමිත කාලාන්තරීය වාර්තා මගින් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සාර්ථකත්වය පිළිබඳ තොරතුරු මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි.	නිරික්ෂණය පරිදි එම ප්‍රතිකාර මධ්‍යස්ථාන අධීක්ෂණයෙන් පසු සංක්ෂිප්ත කාලාන්තරීය වාර්තාවක් මණ්ඩලය වෙත යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	වාර්ථා ඉදිරිපත් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිස් අවුරුදු බදු පදනම මත ලබාගත් නව දිගන්තය පරිශ්‍රයෙහි ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික සහයෙන් රු.7,051,924 ක ඇස්තමේන්තු වටිනාකමකට ඉදිකිරීමට සැලසුම් කර තිබූ නව ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා 2021 වර්ෂයේදී රු.5,000,000 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබුණි. ඉන් රු.3,541,976 ක් ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා අනිකුත් සේවා වෙනුවෙන් වැයකර තිබුණු අතර රු.2,100,397 ක ද්‍රව්‍ය ගොඩනැගිල්ල අර්ධ වශයෙන් ඉදිකිරීමට වැයකර ඉදිකිරීම අතරමග නවතා තිබුණි. එදිනට ඉතිරි වී තිබුණු ද්‍රව්‍ය වටිනාකම රු.1,441,579 ක් විය. 2024 ජූලි මස සිදුකරන ලද භෞතික තොග පරීක්ෂාවට අනුව අයිතම 19 ක ද්‍රව්‍ය කල් ඉකුත් වී තිබුණි.මෙම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකර භාවිතයට ගැනීම සඳහා රු.7,721,116 ක ඇස්තමේන්තුවක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2024 සැප්තැම්බර් 07 දින මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද, 2025 මැයි 23 විගණිත දින වනවිටත් එහි වැඩ ආරම්භ කර නොතිබුණි.	ඉදිකිරීම් අතරමඟ නතර කිරීම සම්බන්ධයෙන් එවකට මණ්ඩලය අයත්ව පැවති රේඛීය අමාත්‍යාංශය වන ආරක්ෂක අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, ඒ අනුව, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නාවික හමුදා ශ්‍රම දායකත්වයෙන් 2025 මැයි 25 වන දින සිට නැවත ආරම්භ කර ඇත.	පරිත්‍යාග ලෙස ලැබෙන මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	මණ්ඩලයට අයත් නව දිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි හිමිනමකගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉදි කර තිබුණු රු.12,800,000 ක් පමණ වටිනා ගොඩනැගිල්ල හා ජාත්‍යන්තර ආයතනයක ආධාර මත ඉදි කර තිබුණු රු.7,844,963 ක් වටිනා ගොඩනැගිල්ල ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතයට ගත හැකි පරිදි සියලු ලී බඩු හා උපකරණ වලින් සමන්විතව ඇතත් 2024 වර්ෂය තුල එම ගොඩනැගිලි ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව	නවදිගන්ත මධ්‍යස්ථානයේ නේවාසිකාගාර 02 ක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් දැනට මධ්‍යස්ථානයේ සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් පැරණි නේවාසිකාගාරයේ ප්‍රතිකාර කටයුතු කරනු ලබයි. ඉදිරියේදී ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන්	පරිත්‍යාග වශයෙන් ලද ගොඩනැගිලි හා ලී බඩු උපකරණ ආර්ථික හා ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කල යුතුය.

	පැවතුණි. නිෂ්කාර්යව පවතින ගොඩනැගිලි දෙකෙහි පුද්ගලයින් 62 ක් හා මධ්‍යස්ථාන භූමියෙහි පවතින දැනට භාවිතා කරන ගොඩනැගිල්ලෙහි පුද්ගලයින් 60 ක් පුනරුත්ථාපනය කිරීමේ පහසුකම් පැවතියද, පැරණි ගොඩනැගිල්ලෙහි පුද්ගලයින් 12-37 අතර ප්‍රමාණයක් පමණක් පුනරුත්ථාපන කටයුතු කරන බව නිරීක්ෂණය විය.ඒ අනුව පුනරුත්ථාපනය කර තිබුණු පුද්ගලයින් සංඛ්‍යාව පුනරුත්ථාපනය කළ හැකිව තිබුණු සංඛ්‍යාවෙන් සියයට 10-30 අතර විය.	අනතුරුව ප්‍රතිකාරලාභීන් සඳහා නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන යළි ක්‍රියාත්මක කළ හැකි බව.	
(ඈ)	තලංගම පිහිටි ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහිද ප්‍රතිලාභීන් 34 ක් සඳහා පහසුකම් පැවතියද මසකට ප්‍රතිලාභීන් 04-11ත් අතර ප්‍රමාණයක් පමණක් ඇතුලත් කරගෙන තිබුණි. දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන මහල සම්පූර්ණයෙන් භාවිතා නොකරන අතර, මධ්‍යස්ථානයෙහි ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතු සඳහා ප්‍රමාණවත් බාහිර පරිසරයක් නොතිබූ අතර ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රමාණවත් එළිමහන් ඉඩ පහසුකම්ද නොතිබුණි.	රාජගිරිය ප්‍රධාන කාර්යාලයේ නඩත්තු කටයුතු අවසන් වූවාට පසුව තලංගම මධ්‍යස්ථානයේ පිළිසකර කටයුතු සිදු කිරීමට නියමිතය. එළිමහන් ඉඩ පහසුකම් නොමැති නිසා ගෘහස්ථ ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇත.ප්‍රතිකාර ලාභීන් මේ සඳහා දෛනිකව යොමුවන අතර,වගකීමෙන් යුතුව ප්‍රතිකාර හා පුනරුත්ථාපන කටයුතුවලට අදාල සියලු අංග සිදු කරනු ලබන බව.	පවතින පහසුකම් ආර්ථික හා ඵලදායී ලෙස භාවිතා කල යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුලදී රු.11,643,921ක වියදමක් දරමින් පවත්වා ගෙනගොස් තිබුණු තලංගම පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි කාන්තා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් පැවතියද, එහි පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට එම මධ්‍යස්ථානයෙහි අනුයුක්ත කර තිබුණු කාන්තා නිළධාරීන් සංඛ්‍යාව 09 ක්වූ අතර, 2025 වර්ෂය ආරම්භයේදී බඳවාගත් කාන්තා නිළධාරීන් 07 දෙනෙකුද ඇතුළුව කාන්තා නිළධාරීන් 16ක් එම මධ්‍යස්ථානයට අනුයුක්තව සිටියද, 2021 වර්ෂයෙන් පසු කිසිදු කාන්තා සේවාලාභියෙකු පුනරුත්ථාපනය කර නොතිබුණි.	2025 මැයි 20 දින සිට කාන්තා මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සඳහා නේවාසික ප්‍රතිකාර පුනරුත්ථාපන වැඩසටහන බස්නාහිර පළාත් නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ (තලංගම මධ්‍යස්ථානයේ) ආරම්භ කර ඇති බව.	කාන්තා සේවාලාභින් පුනරුත්ථාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.
(ඉ)	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරිම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/21/2279/303/176 මගින් අනුමැතිය ලබා දී තිබුනද පනතට අදාළ සංශෝධන කටයුතු නිම කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි.	අධිකරණ අමාත්‍යාංශය මඟින් මෙම පනත සංශෝධනය කිරීම සිදු කරන අතර මණ්ඩලයේ අවසන් නිර්දේශ 2023 සැප්තැම්බර් 25 දින අධිකරණ අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	පනත සංශෝධන කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගත යුතුයි.

(ඊ)	2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් තැනැත්තන් අතරින් හෝ අන්තරාදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු පිළිබඳ පලපුරුද්ද හා දැනුම ඇති තැනැත්තන් අතරින් දහදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබුණි.	මේවන විට තුලනීක්ෂණ මණ්ඩල සංශෝධනය ඇතුළුව පනත සංශෝධනය කර අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	-එම-

3.3 මානව සම්පත් කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දිනට, සමස්ථ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රධාන කාර්යාලය හා පළාත් කාර්යාලයද ඇතුළුව 374 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 186 ක් විය.ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 188ක් විය.පවතින කාර්ය මණ්ඩල පිළිබඳ සමාලෝචනයක් වසර 05කට ආසන්න කාලයක් සිදුකර නොතිබූ අතර සත්‍ය වශයෙන් අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි	2021 අගෝස්තු 31 දිනැති අංක 21/1596/304/134 දරන මුදල් අමාත්‍යංශයේ හා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව, බඳවාගැනීම් තාවකාලිකව නවත්වා ඇති බැවින් මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට නොහැකිවී ඇති බව.	කාර්ය මණ්ඩලය පිළිබඳ සමාලෝචනයක් සිදුකර පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය.